SEDR
Supporting Effective Dispute Resolution
එලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# Supporting Effective Dispute Resolution

# Your document title

<u>ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය:</u>

*සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම - SEDR වෙතින් පාඩම් සහ ගැඹුරු දැනුම*

1. **<u>සැසිවාරයේ මාතෘකාව</u>**

   තේමාත්මක සැසිවාර අංක 4:

   *දර්ශනයක් නිර්මාණය කිරීම: කලාව තුළින් ජන හඬ නගන්නේ කෙසේද?*

2. **<u>දිනය, වේලාව සහ ස්ථානය</u>**

   2025 අප්‍රේල් 29 අඟහරුවාදා
   11:30 – 12:30
   ස්ථානය: ඕක් කාමරය

3. **<u>සංකල්පයේ සාරාංශය / හැඳින්වීම</u>**

   1960 ගණන්වලදී, එඩ් රයින්හාර්ඩ් ‘කලාව කලාවයි. අනෙක් සියල්ල අනෙක් සියල්ලමයි’ යනුවෙන් ප්‍රකාශ කළේය. වසර හැටකට පසුවත්, මෙම වෙනස තවමත් පවතී ද? කලාව තවමත් ‘අනෙක් සියල්ලෙන්’ වෙන්ව තිබේ ද? නැතහොත් ප්‍රජාව සමඟ තවදුරටත් වඩාත් සෘජුව සම්බන්ධ වීමට තරම් එය ව්‍යාප්තවී තිබේ ද? සාමූහික ක්‍රියාකාරිත්වය සඳහා කලාවන්ට නව ගැඹුරු දැනුමක් හෝ ගතික අවකාශයක් ලබා දිය හැකි ද?

Part of the programme
STRIDE Strengthening Transformation, Reconciliation and Inclusive Democratic Engagement
Funded by the European Union
Implemented by
British Council
The Asia Foundation

2023 වසරෙහි දී, SEDR ආයතනය විසින් ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA) සමඟ හවුල් වී නව්‍ය Arts-4-ADR ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම සැසිවාරයේදී, SEDR අරමුදලින් කොටසක් ලෙස ශ්‍රී ලංකා MMCA විසින් සංවර්ධනය කරන ලද කලා පාදක සංවාද ක්‍රමවේදයක් ගවේෂණය කරනු ඇති අතර, එය විකල්ප ආරවුල් නිරාකරණය කිරීමේ (ADR) සහ ශ්‍රී ලංකාවේ දිගුකාලීන ඉඩම් පාදක ආරවුල්වල මූල හේතු සමඟ ගනුදෙනු කිරීමට අවශ්‍ය තීරණාත්මක සම්බන්ධතාවයට පහසුකම් සැලසීම සඳහා සහභාගීත්ව පර්යේෂණ, දෘශ්‍යමාන කතන්දර කීම සහ ප්‍රජා සංවාදය යනාදිය ඒකාබද්ධ කරනු ඇත.

මෙම සැසිවාරයේදී ජැස්මින් නිලානි ජෝසප්, හනුෂා සෝමසුන්දරම් සහ අනෝමා රාජකරුණා ආදි අය විසින් නිර්මාණය කරන ලද කලා කෘති තුනක් සාකච්ඡා කරනු ලබන අතර, මෙම කලා කෘතීන් SEDR ප්‍රදාන ව්‍යාපෘතියේ කොටසක් ලෙස සකස් කරනු ලැබ, 2024 වසරෙහි දී උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල දිස්ත්‍රික්ක හයක ප්‍රජා සාමාජිකයින් සමඟ සහයෝගයෙන් සංවර්ධනය කරන ලදී. මෙම කලා කෘති ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංවාද සඳහා උත්තේජක බවට පත් වූ ආකාරය, ආධිපත්‍යමය ආරවුල් පිළිබඳ ආඛ්‍යාන අභියෝගයට ලක් කළ ආකාරය සහ ප්‍රජා ආරවුල්වල මූල හේතු සහභාගීත්ව ක්‍රමය යටතේ හඳුනා ගැනීම සඳහා අවකාශයක් ලබාදීමට පහසුකම් කළ ආකාරය යනාදිය සැසිවාරයේදී ගවේෂණය කරනු ඇත. මෙම සැසිවාරයේදී, ඉතිහාසයේ දුෂ්කර කාලවල සමථකරණය කිරීම, ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ඉගෙනීම, ප්‍රතිපත්ති මට්ටමේ ක්‍රියාවන්වල යෙදී සිටින ප්‍රමාණය සහ කලාත්මක සමථකරණය කිරීමේ නව ආකෘති ඉස්මතු කිරීම වැනි ක්‍රියාවන්වල යෙදෙන අතරතුර ඒවායේ සීමාවන් විවේචනාත්මකව පරීක්ෂා කරමින්, කලා පාදක ආයතනවල ගුණාත්මක බලපෑම පිළිබඳ පවත්වනු ලබන සාකච්ඡාවකින් සැසිවාරය අවසන් වනු ඇත.

## 4. <u>සැසිවාරයේ පරමාර්ථ</u>

මෙම සැසිවාරය පහත සඳහන් දෑ අරමුණක් කොට පවත්වනු ලැබේ.

- ප්‍රජා ආරවුල්, ප්‍රවේශ විය හැකි ආඛ්‍යාන බවට පරිවර්තනය කරන සංවාද මෙවලම් ලෙස සකස් කරන ලද කලා කෘතිවල කාර්යභාරය ප්‍රදර්ශනය කිරීම.
- කලාව පදනම් කරගත් ප්‍රවේශයන් ආරවුල්වල මූල හේතු සොයා ගැනීම පිළිබඳව ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන විමර්ශනය වැඩි දියුණු කරන ආකාරය නිරූපණය කිරීම මඟින් Arts-4-ADR හරහා සංවර්ධනය කරන ලද සංවාද ක්‍රමවේදය දීප්තිමත් කිරීම.
- ඉඩම් අයිතිවාසිකම් පිළිබඳ වැඩි දැනුවත්භාවය, මහජන දෘෂ්ටි කෝණයේ වෙනස්වීම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහභාගීත්වය ඇතුළුව ව්‍යාපෘතියේ ගුණාත්මක බලපෑම පිළිබඳ ගවේෂණය කිරීම.
- අනාගත ආරවුල් සමථ කිරීමේ ව්‍යාපෘති සඳහා කලා පාදක ADR උපාය මාර්ගවල පරිමාණය පිළිබඳ සාකච්ඡාවට පහසුකම් සැපයීම.

## 5. <u>මධ්‍යස්ථකරු / පහසුකම් සපයන්නා</u>

මධ්‍යස්ථකරු: නතාලි ජොන්ස්ටන් මහත්මිය, ස්වාධීන කලා භාරකරු.

## 6. <u>කථිකයන් / විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන් / ඉදිරිපත් කරන්නන්</u>

- ඉදිරිපත් කරන්නා: සන්දේව් හැන්ඩි මහතා: ජ්‍යෙෂ්ඨ භාරකරු, නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: ෂාමිණී පෙරෙයිරා මෙනෙවිය: ප්‍රධාන භාරකරු, නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: ජැස්මින් නිලානි ජෝසප් මෙනෙවිය, කලාකාරිනිය